# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 29 දරන
# පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1990 ජූලි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 29 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 34/90

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1990 අංක 29 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඩු නාමය.

2. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ (8) (ඇ) වන ව්‍යවස්ථාව යටතේ කරන ලද ආඥාවක හේතුවෙන් පළාත් සභාවක් විසුරුවා හැරීමෙන් පුරප්පාඩුවක් ඇතුළත හෝ මේ පනත යටතේ පවත්වනු ලබන පළමුවන ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ විට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ (8) (ඇ) වන ව්‍යවස්ථාව යටතේ කරන ලද ආඥාවක හේතුවෙන් පළාත් සභාවක් විසුරුවා හැරීමෙන් සතියක් ඇතුළත හෝ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 5අ වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් පළාත් සභාවක් විසිරීමෙන් සතියක් ඇතුළත හෝ මේ පනත යටතේ පවත්වනු ලබන පළමුවන ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ විට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙසින් සංශෝධනය කරනු ලැබේ. — 1988 අංක 2 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.